මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) ලේකම් කාර්යාලය

# නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු බඳවා ගැනීම

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ e-GP පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලයේ (e-GP ලේකම් කාර්යාලය) පවත්නා පහත සඳහන් තනතුර පිරවීම සඳහා අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් පළපුරුදු අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS2) තනතුරු 01

**මාසික වේතනය :** (සියලු දීමනා ඇතුළත්ව) රුපියල් 84,000/=

**වයස් සීමාව :** අවුරුදු 62 ට අඩු විය යුතුය.

**සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය/ ආර්ථික විද්‍යාව/ ව්‍යාපෘති කළමනාකරණය හෝ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් ඉහත ක්ෂේත්‍රයක වෙනත් සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, ඉහත ක්ෂේත්‍රයක ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්,

**සමග**

අවම වශයෙන් සුදුසුකම් ලැබීමෙන් පසුව, කළමනාකරණ තලයේ අවම වසර 07 ක පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 3 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

**හෝ**

2. රජයේ දීපව්‍යාප්ත සේවයක 1 ශ්‍රේණිය නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්.

**සමග**

1 ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර 2 ක පළපුරුද්ද.

IT ව්‍යාපෘති කළමනාකරණය, රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලන ක්ෂේත්‍රයේ ඉහළ දැනුමක් සහ දේශීය/ විදේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත අයදුම්කරුවන්හට ප්‍රමුඛතාව හිමිවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

අදාළ සුදුසුකම් හා පළපුරුද්ද පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**බඳවා ගැනීමේ පදනම :**

එක් වසරක කොන්ත්‍රාත් පදනමින් සිදුකෙරේ. (කාර්යසාධනය මත දීර්ඝ කිරීම් කළ හැක)

**නියමයන් හා කොන්දේසි :**

මෙම පත්කිරීම් සඳහා, 2019.03.16 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා ඉන්පසුව නිකුත් කළ චක්‍රලේඛයන්හි සඳහන් සියලුම කොන්දේසි අදාළ වේ.

තනතුරට අදාළව අවශ්‍ය අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය ලේඛණද ඇතුළත්ව සකස් කළ ජීව දත්ත අයදුම්පත් 2022.10.10 දිනට පෙර පහත සඳහන් ඊමේල් ලිපිනය වෙත පමණක් යොමු කරන්න.

**egphr@promise.lk**

**අධ්‍යක්ෂ, e-GP ලේකම් කාර්යාලය, 2 වන මහල, නවගොඩනැගිල්ල,**

**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,**

**2022.10.02**